සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2025 ජනවාරි

## (301) මූල්‍ය වාර්තාකරණය

(Financial Reporting)

2025-02-01
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන : 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

අනාගතයේදී ගිණුම්කරණ වෘත්තිය සැලකිය යුතු වෙනස්කම්වලට භාජනය වන අතර, වෘත්තීය ආයතනවලට, ඒවායේ සාමාජිකයින්ට හා අධ්‍යාපන ආයතනවලට එම වෙනස්කම්වලට ප්‍රතිචාර දැක්වීමට සිදුවේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ගිණුම්කරණ වෘත්තියෙහි නව ප්‍රවණතාවන් තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගන්නා ලද මූලිකාංග (elements), මූල්‍ය පදනමක් මත මනිනු ලබන අතර, ඒ සඳහා මැනීමේ පදනමක් තෝරා ගැනීම අවශ්‍ය වේ.

(b) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව අනුව, මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග මැනීම සඳහා භාවිත කරනු ලබන මැනීමේ පදනම් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

මෑත කාලයේදී තිරසාර වාර්තාකරණය (Sustainability Reporting), සංකලිත වාර්තාකරණයෙහි වැදගත් කොටසක් බවට පත්වී ඇති අතර, එමගින් මූල්‍ය හා මූල්‍ය නොවන මාපකයන් ඒකාබද්ධ කරනු ලබයි. ව්‍යාපාර වටිනාකම් හා ආචාරධර්ම, තිරසාරකරණයෙහි ක්‍රියාකාරකම් යනාදිය සංකලිත වාර්තාකරණය මගින් ආවරණය වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) තිරසාර වාර්තාකරණයෙහි ප්‍රධාන අරමුණ **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) සංකලිත වාර්තාකරණයෙහි, මඟ පෙන්වීමේ මූලධර්ම (guiding principles) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත XYZ සමාගමෙහි,** 2024 මාර්තු 31 දිනෙන් හා 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා අදාල දළ ලාභ අනුපාතය සහ ණයගැති එකතුකිරීමේ කාලය පහත සඳහන් පරිදි වේ:

| මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2024 | 2023 |
|---|---|---|
| දළ ලාභ අනුපාතය | 28% | 45% |
| ණයගැති එකතුකිරීමේ කාලය | දින 128 | දින 65 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉදිරි වර්ෂවලදී ඉහත අනුපාතයන්හි වර්ධනයක් ඇතිකර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගය බැගින් **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 02)

(b) අනුපාත විශ්ලේෂණයෙහි සීමා තුනක්(03) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත Omega සමාගමෙහි** ගිණුම් පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත:

(1) 2024 ජනවාරි 01 දින, නව නිෂ්පාදිතයක් සංවර්ධනය කිරීමට අදාලව සමාගම විසින් වෙළෙඳපොළ සමීක්ෂණයක් සිදුකර ඇති අතර, මෙම අරමුණ සඳහා සමීක්ෂණ ආයතනයකට රු. මිලියන 2 ක් ගෙවා ඇත.

(2) 2024 මාර්තු 20 දින, මෙම නිෂ්පාදිතයට අදාල පේටන්ට් (ස්වාධිකාර) අයිතිය, රු.75,000/- ක වියදමක් දරා ලියාපදිංචි කර ඇත.

(3) වර්ෂය තුළදී, සමාගමේ කළමනාකරුවන් සඳහා විදේශ රටක පුහුණුවක් ලබාදීමට සමාගම විසින් රු. මිලියන 10 ක් වියදම් කර ඇත. මෙම පුහුණුවෙහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමෙහි කළමනාකරුවන්ගේ කාර්යසාධනය වර්ධනය වනු ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 38 - අස්පෘශ්‍ය වත්කම් අනුව, ඉහත එක් එක් පිරිවැය, අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගත හැකිද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත සූර්යා (පෞද්ගලික) සමාගමේ** 2024 මාර්තු 31 දිනට සහ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

**සීමාසහිත සූර්යා (පෞද්ගලික) සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| මාර්තු 31 දිනට | 2024 | 2023 |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 21,500 | 20,100 |
| සමුච්චිත ක්ෂය | (2,900) | (2,400) |
| **ධාරණ අගය** | **18,600** | **17,700** |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 16,800 | 5,000 |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු මුදල් | 5,545 | 18,410 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 2,050 | 2,200 |
| | **24,395** | **25,610** |
| **මුළු වත්කම්** | **42,995** | **43,310** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 2,500,000) | 25,000 | 25,000 |
| රඳවාගත් ඉපැයීම් | 6,600 | 4,100 |
| | **31,600** | **29,100** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 5,400 | 6,000 |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම) | 390 | 350 |
| | **5,790** | **6,350** |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල් | 5,170 | 7,590 |
| ණය මත ගෙවිය යුතු පොලිය | 435 | 120 |
| ගෙවිය යුතු ආදායම් බදු | - | 150 |
| | **5,605** | **7,860** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **42,995** | **43,310** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පසු ලාභය රු.2,730,000/- ක් වූ අතර, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු.720,000/- ක් විය.

(2) වර්ෂය තුළදී, සමාගම විසින් රු.2,000,000/- ක නව දිගු කාලීන ණය මුදලක් ලබාගෙන ඇත. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණය මත පොළී වියදම රු.1,000,000/- ක් විය.

(3) 2023 අප්‍රේල් 01 දින, සමාගම විසින් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති යන්ත්‍රයක් රු.200,000/- ක මුදලකට විකුණා ඇත. මෙම යන්ත්‍රයේ පිරිවැය රු.700,000/- ක් විය. 2023 අප්‍රේල් 30 දින විකුණන ලද යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් මිලදී ගන්නා ලද අතර, එය එදිනම ප්‍රාග්ධනීත කරන ලදී.

(4) වර්ෂය තුළදී, සාමාන්‍ය කොටස්හිමියන්ට අතුරු ලාභාංශ වශයෙන් සමාගම විසින් රු.230,000/- ක් ගෙවන ලදී.

(5) වර්ෂය සඳහා සේවක පාරිතෝෂික සඳහා වන ප්‍රතිපාදනය රු.120,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත සූර්යා (පෞද්ගලික) සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, <u>වක්‍ර ක්‍රමය යටතේ</u> **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(a) සේවක ප්‍රතිලාභ යනු ව්‍යාපාරයක් විසින් එහි සේවකයින් විසින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් හෝ සේවා නියුක්තිය අවසන් කිරීම වෙනුවෙන් ගෙවනු ලබන සියලු ආකාරයේ ගෙවීම් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

කෙටිකාලීන සේවක ප්‍රතිලාභ යනු කුමක්දැයි යන්න උදාහරණ දෙකක්(02) ද සහිතව **පැහැදිලි කරන්න.**

(ලකුණු 04)

(b) 2023 අප්‍රේල් 01 දින, **සීමාසහිත පබ්ලික් ලීසිං සමාගම** විසින් **සීමාසහිත Singhe සමාගමට** මෝටර් ලොරි රථයක් වර්ෂ 5 ක මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ විකුණා ඇත. මෝටර් ලොරි රථයේ සාධාරණ වටිනාකම රු.6,800,000/- ක් වූ අතර, **සීමාසහිත Singhe සමාගම** විසින් 2023 අප්‍රේල් 01 දින, අත්තිකාරම් මුදලක් වශයෙන් රු.2,000,000/- ක් ගෙවා ඇත. වාර්ෂික කල් බදු වාරිකයක වටිනාකම රු.1,534,934/- ක් වන අතර, එය එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී ගෙවිය යුතු වේ. ව්‍යංග (implied) පොළී අනුපාතිකය වර්ෂයකට 18% ක් වේ. **සීමාසහිත Singhe සමාගම** විසින් කල් බද්දේ පළමු වාරිකය, 2024 මාර්තු 31 දින ගෙවා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත පබ්ලික් ලීසිං සමාගමේ** (කල්බදු හිමියා) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / දිනට අදාලව පහත සඳහන් ලෙජර් ගිණුම් **පිළියෙල කරන්න**:

(i) ලැබිය යුතු කල්බදු ගිණුම. (ලකුණු 04)

(ii) නොඉපයූ මූල්‍ය ආදායම් ගිණුම. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

(a) **සීමාසහිත Beta සමාගමේ** 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා වන අනුමැතිය 2024 ජූනි 30 දින ලබාදෙන ලදී. මූල්‍ය වර්ෂයේ අවසන් දිනෙන් පසුව පහත සඳහන් සිදුවීම් සිදුවී ඇති බවටත් ඒවා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගෙන නොමැති බවටත් මූල්‍ය කළමනාකරුට පසුව අනාවරණය විය:

(1) සමාගමේ නිෂ්පාදිතයක් භාවිත කිරීමෙන් හටගන්නා ලද සෞඛ්‍ය හානියකට අදාල වන්දි වශයෙන් සමාගමෙන් රු.1,000,000/- ක වන්දියක් ඉල්ලා 2024 මාර්තු 31 දින **සීමාසහිත Beta සමාගමේ** ගනුදෙනුකරුවෙකු විසින් සමාගමට විරුද්ධව නඩුවක් පවරා ඇත. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය දුන් දිනය දක්වා පවතින සාක්ෂි මත පදනම්ව, සමාගමට මෙම වන්දිය ගෙවීම සඳහා අඩු සම්භාවිතාවයක් පවතින බව සමාගමේ නීතීඥවරයා විශ්වාස කරනු ලබයි.

(2) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභය මත අවසාන ලාභාංශය, 2024 අප්‍රේල් 10 දින **සීමාසහිත Beta සමාගමේ** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කරන ලදී.

(3) ආදායම් බද්ද ගණනය කිරීමේදී, සමාගම විසින් ඉඩ දුන් වියදම් ලෙස සළකන ලද රු. මිලියන 2 ක් වූ ඇතැම් වියදම් ඉඩ නොදෙමින් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් තක්සේරුවක් නිකුත් කර ඇත. සාකච්ඡා වට කිහිපයකින් අනතුරුව, 2024 අප්‍රේල් 30 දින රු. මිලියන 1.5 ක වියදම් ඉඩ නොදීමට ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් එකඟ වී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත එක් එක් සංසිද්ධිය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් අනුව, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත Beta සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුත්තේ කෙසේදැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(b) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) -23 ණය ගැනුම් පිරිවැය ප්‍රමිතයට අනුව, සුදුසුකම්ලත් වත්කම් වෙනුවෙන් දරණ ලද ණය පිරිවැය ප්‍රාග්ධනීත කළ හැකිය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) - 23 ණය ගැනුම් පිරිවැය අනුව, "සුදුසුකම්ලත් වත්කමක්" (Qualifying Asset) යන පදය උදාහරණයක්ද සහිතව **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) - 23 අනුව, ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනීත කිරීම ආරම්භ කිරීම සඳහා සපුරාලිය යුතු කොන්දේසියක් **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත** Safe Wheel **පොදු සමාගමේ** ගිණුම් පොත්වලින් 2024 මාර්තු 31 දිනට, පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත:

**සීමාසහිත Safe Wheel පොදු සමාගම**

**2024 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 30,000,000) | | 300,000 |
| 2023 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 51,000 |
| **දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට:** | | |
| ඉඩම සහ ගොඩනැගිලි (ඉඩමේ පිරිවැය - රු. මිලියන 90) | 126,000 | |
| යන්ත්‍ර | 60,000 | |
| මෝටර් වාහන | 12,000 | |
| **2023 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| ගොඩනැගිලි | | 15,000 |
| යන්ත්‍ර | | 18,000 |
| මෝටර් වාහන | | 5,000 |
| වත්කම් ඉවත් කිරීමේ ගිණුම | | 5,500 |
| ප්‍රාග්ධන නොනිමි වැඩ | 95,000 | |
| 2024 මාර්තු 31 දිනට තොගය, පිරිවැයට | 94,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 91,000 | 24,000 |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් / බැංකු අයිරාව | 38,000 | 12,000 |
| 2023 අප්‍රේල් 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා වන ප්‍රතිපාදනය | | 16,500 |
| දිගු කාලීන ණය | | 50,000 |
| ගෙවූ ආදායම් බදු | 10,000 | |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 161,000 | 317,000 |
| වෙනත් ආදායම් | | 1,500 |
| ඉදිරියට කළ ගෙවීම් | 3,600 | |
| ගෙවූ අතුරු ලාභාංශ | 15,000 | |
| පරිපාලන වියදම් | 68,500 | |
| බෙදාහැරීමේ වියදම් | 33,400 | |
| මූල්‍ය වියදම් | 8,000 | |
| | **815,500** | **815,500** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2021 ඔක්තෝම්බර් 01 දින, රු.6,000,000/- කට මිලදීගත් මෝටර් රථයක්, 2024 මාර්තු 31 දින රු.5,500,000/- ක මුදලකට විකුණා ඇත. විකිණීමෙන් ලද මුදල, මුදල් ගිණුමට හර කර වත්කම් ඉවත්කිරීමේ ගිණුමට බැර කර ඇත. මේ හැර මේ සම්බන්ධයෙන් ගිණුම් පොත්වල වෙනත් කිසිදු සටහනක් සිදුකර නොමැත.

(2) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර, එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂ 50 |
| යන්ත්‍ර | : | වර්ෂ 10 |
| මෝටර් වාහන | : | වර්ෂ 04 |

(3) 2024 මාර්තු 31 දින, සමාගම විසින් යන්ත්‍ර සඳහා හානිකරණ පරීක්ෂාවක් සිදුකරන ලද අතර, එහිදී අනාවරණය වූයේ යන්ත්‍රයේ ඉවත් කිරීමේ පිරිවැය අඩුකල පසු සාධාරණ වටිනාකම රු.30,000,000/- ක් වන බවත්, යන්ත්‍රයේ භාවිතයට ගැනීමේ අගය රු.34,000,000/- ක් වන බවත්ය. මෙම හානිකරණය සම්බන්ධයෙන් ගිණුම් පොත්වල කිසිදු ගැලපීමක් සිදුකර නොමැත.

(4) සමාගම, තම නව කර්මාන්තශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම 2023 ජුනි 01 දින ආරම්භ කරන ලද අතර, එම ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම්, 2024 ජුනි 30 දින වන විට අවසන් කර භාවිතයට ගැනීම, සමාගමේ අරමුණයි. ඉදිකිරීම් සඳහා දරණ ලද පිරිවැය, ප්‍රාග්ධන නොනිමි වැඩ ගිණුමෙහි වාර්තා කර ඇත. 2023 ජූලි 01 දින, සමාගම, 15% ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ රු. මිලියන 50 ක ණය මුදලක් දේශීය බැංකුවකින් ලබාගෙන ඇති අතර, එම සම්පූර්ණ ණය මුදලම මෙම ඉදිකිරීම් කටයුතු සඳහා භාවිත කරන ලදී. ණය මුදල, සමාන වාරික 60 කින් ගෙවනු ලබන අතර, ණය මුදලේ ප්‍රාග්ධනය ආපසු ගෙවීම්, 2024 අප්‍රේල් 01 දින සිට ආරම්භ කරන ලදී. මෙම ණය මුදල මත වර්ෂයට අදාල පොලිය, මූල්‍ය වියදම් තුළ ඇතුළත් කර ඇත.

(5) පසුගිය මූල්‍ය වර්ෂයේදී පරිපාලන වියදමක් ලෙස කපා හරින ලද රු.1,400,000/- ක බොල්ණයක් වර්ෂය තුළදී නැවත අයකරගෙන තිබේ. මෙම ලැබූ මුදල, වෙළෙඳ ලැබිය යුතු මුදල් ගිණුමට බැර කර ඇත. තවද, 2024 මාර්තු 31 දිනට පවතින ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 5% ක ප්‍රතිපාදනයක් වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා පවත්වා ගැනීමට කළමනාකරණය තීරණය කර ඇත.

(6) 2023/24 මූල්‍ය වර්ෂයට අදාල විගණන හා බදු උපදේශන ගාස්තු පිළිවෙලින් රු.800,000/- ක් සහ රු.500,000/- ක් වන අතර, ඒවා 2024 ජුනි මාසයේදී ගෙවා ඇත. කෙසේනමුත්, මේවා 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්ගත කර නොමැත. ඉදිරියට කළ ගෙවීම් ගිණුමෙන් නිරූපණය වනුයේ, 2024 සම්පූර්ණ ලිත් වර්ෂයට අදාලව ගෙවන ලද බදු කුලිය වේ.

(7) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාල වූ රු.250,000/- ක ස්ථාවර තැන්පතුවක් මත පොලී ආදායම, 2024 අප්‍රේල් 02 දින ලැබී ඇත. එය 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්තා කර නොමැත.

(8) 2023 මාර්තු 31 දිනට ඉදිරියට ගෙවූ හා ගෙවිය යුතු ආදායම් බදු නොතිබූ අතර, 2023/24 තක්සේරු වර්ෂය සඳහා වන සම්පූර්ණ ආදායම් බදු වගකීම, රු.12,450,000/- ක් ලෙස ඇසතමේන්තුගත කර ඇත. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී ගෙවූ ආදායම් බදු, "ගෙවූ ආදායම් බදු" ගිණුමට හර කර ඇත.

(9) 2024 ජනවාරි 01 දින, රු.15,000,000/- ක අතුරු ලාභාංශයක් සාමාන්‍ය කොටස්හිමියන්ට ගෙවා ඇත. තවද, 2024 මැයි 21 දින පැවති සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී කොටසකට ශත 50 බැගින් වූ අවසන් ලාභාංශයක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබාදෙන ලදී. මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය, 2024 ජුනි 30 දින ලබාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත Safe Wheel පොදු සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 10)

(b) 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 08)

(c) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 03)

(d) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන සටහන. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

පහත සඳහන් තොරතුරු, 2024 මාර්තු 31 දිනට සහ 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂවලට / අවසන් දිනවලට අදාලව **සීමාසහිත ශක්ති පොදු සමාගමෙන්** උපුටාගෙන ඇත:

| මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා | 2024 (රු.'000) | 2023 (රු.'000) |
|---|---|---|
| විකුණුම් | 1,683,700 | 1,487,900 |
| විකුණුම් පිරිවැය | (1,321,800) | (1,286,700) |
| දළ ලාභය | 361,900 | 201,200 |
| පොලී වියදම | (17,540) | (16,280) |
| ආදායම් බදු | (13,800) | (14,250) |
| බදු පසු ශුද්ධ ලාභය | 136,450 | 119,820 |
| **මාර්තු 31 දිනට** | **2024** | **2023** |
| ජංගම වත්කම් | 899,500 | 1,149,200 |
| ජංගම වගකීම් | 121,900 | 119,800 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 541,500 | 419,800 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 115,720 | 110,910 |
| තොගය | 111,400 | 109,600 |
| පොලී සහිත ණය | 51,470 | 56,420 |
| කොටස්හිමියන්ගේ ස්කන්ධය | 167,850 | 31,400 |
| නිකුත් කරන ලද කොටස් ගණන ('000) | 19,500 | 19,500 |

මුළු විකුණුම්වලින් 60% ක් ණයට කළ විකුණුම් වන අතර, ගැනුම්වලින් 90% ක් ණය පදනම මත සිදු කරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට පහත සඳහන් අනුපාතයන් **ගණනය කරන්න**:

(i) දළ ලාභ අනුපාතය.

(ii) ශුද්ධ ලාභ අනුපාතය.

(iii) ණයගැති එකතුකිරීමේ කාලය.

(iv) ණයහිමි පියවීමේ කාලය.

(v) කොටසක ඉපැයුම. (ලකුණු 05)

(b) **සීමාසහිත ශක්ති පොදු සමාගම** අයත් කර්මාන්තයේ, කර්මාන්ත සාමාන්‍ය අනුපාතිකයන් පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| දළ ලාභ අනුපාතය | 44% |
| ශුද්ධ ලාභ අනුපාතය | 12% |
| ණයගැති එකතුකිරීමේ කාලය | දින 105 |
| ණයහිමි පියවීමේ කාලය | දින 65 |
| කොටසක ඉපැයුම | රු.7.50 |

**සීමාසහිත ශක්ති පොදු සමාගමේ** ඉහත සඳහන් අනුපාතයන්, කර්මාන්ත සාමාන්‍යයන් සමඟ සසඳමින් විචලනයන්ට හේතු විය හැකි කරුණු පැහැදිලි කරමින් සාරාංශ වාර්තාවක් **පිළියෙළ කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 10 වන ප්‍රශ්නය

2023 අප්‍රේල් 01 දින, **සීමාසහිත Enrich පොදු සමාගම, සීමාසහිත Kanrich පොදු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන්, 80% ක් රු. මිලියන 65 කට අත්පත් කරගන්නා ලදී. **සීමාසහිත Enrich පොදු සමාගමේ** සහ **සීමාසහිත Kanrich පොදු සමාගමේ** 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| **2024 මාර්තු 31 දිනට** | **සීමාසහිත Enrich පොදු සමාගම** | **සීමාසහිත Kanrich පොදු සමාගම** |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ අගයට | 90,000 | 60,000 |
| **සීමාසහිත Kanrich පොදු සමාගමෙහි** සිදුකළ ආයෝජනය | 65,000 | - |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 12,000 | 18,000 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල් | 18,000 | 17,000 |
| **සීමාසහිත Kanrich පොදු සමාගමෙන්** ලැබිය යුතු මුදල | 2,000 | - |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 6,000 | 2,500 |
| | 38,000 | 37,500 |
| **මුළු වත්කම්** | **193,000** | **97,500** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 120,000 | 70,000 |
| රඳවාගත් ඉපැයීම් | 26,900 | 12,000 |
| | 146,900 | 82,000 |
| **ජංගම නොවන වගකීම්:** | | |
| සේවක ප්‍රතිලාභ | 7,500 | 3,100 |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 32,000 | 9,050 |
| **සීමාසහිත Enrich පොදු සමාගමට** ගෙවිය යුතු මුදල | - | 2,000 |
| ගෙවිය යුතු ආදායම් බදු | 6,600 | 1,350 |
| | 38,600 | 12,400 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **193,000** | **97,500** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) අත්පත් කරගත් දිනට, පාලනය නොවන හිමිකමෙහි සාධාරණ අගය [Non-Controlling Interest (NCI)] රු. මිලියන 20 ක් වූ අතර, **සීමාසහිත Kanrich පොදු සමාගමෙහි** හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සාධාරණ වටිනාකම, ඒවායේ පොත් අගයට සමාන වේ. අත්පත් කරගත් දිනට **සීමාසහිත Kanrich පොදු සමාගමෙහි** රඳවාගත් ඉපැයීම් රු.4,500,000/- ක් විය.

(2) 2023 අප්‍රේල් 01 දිනට, ධාරණ අගය රු.2,000,000/- ක් වූ යන්ත්‍රයක් රු.3,000,000/- කට **සීමාසහිත Enrich පොදු සමාගම** විසින් **සීමාසහිත Kanrich පොදු සමාගමට** 2023 අප්‍රේල් 01 දින විකුණා ඇත. එදිනට යන්ත්‍රයේ ඉතිරි ප්‍රයෝජනවත් ආයු කාලය වර්ෂ 5 ක් විය. යන්ත්‍රය විකිණීමෙන් ලද ලාභය, **සීමාසහිත Enrich පොදු සමාගමේ** වෙනත් ආදායම් තුළ ඇතුළත් කර ඇත.

(3) වර්ෂය තුළදී, රු.6,000,000/-ක් වටිනා භාණ්ඩ, **සීමාසහිත Kanrich පොදු සමාගම** විසින් **සීමාසහිත Enrich පොදු සමාගමෙන්** මිලදීගෙන ඇත. එම භාණ්ඩවලින් 1/5 ක ප්‍රමාණයක් නොවිකිණී **සීමාසහිත Kanrich පොදු සමාගම** තුළ පවතී. **සීමාසහිත Enrich පොදු සමාගමේ** විකුණුම් ප්‍රතිපත්තිය වනුයේ පිරිවැය මත 20% ක ලාභයක් පවත්වා ගැනීමයි. මෙම ගනුදෙනුවට අදාලව 2024 මාර්තු 31 දිනට ගෙවිය යුතු රු. මිලියන 2 ක මුදලක්, **සීමාසහිත Enrich පොදු සමාගමේ** ලැබිය යුතු මුදල් තුළත් **සීමාසහිත Kanrich පොදු සමාගමේ** ගෙවිය යුතු මුදල් තුළත් ඇතුළත් කර ඇත.

(4) 2024 මාර්තු 31 දින සිදුකරන ලද හානිකරණ පරීක්ෂණයේදී අනාවරණය වූයේ සමාගම අත්පත් කර ගැනීමෙන් ඇති වූ කීර්තිනාමය, රු.6,000,000/- කින් හානිකරණය වී ඇති බවයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත Kanrich පොදු සමාගම** අත්පත් කර ගැනීම මත ඇති වූ කීර්තිනාමය **ගණනය කරන්න.** (ලකුණු 04)

(b) 2024 මාර්තු 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය **පිළියෙල කරන්න.** (ලකුණු 11)

(මුළු ලකුණු 15)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |